# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1803/03 - 2013 මාර්තු මස 25 වැනි සඳුදා - 2013.03.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි I වැනි උපලේඛනයේ I වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූද, එම උපලේඛනයේ II වැනි තීරුවේ තදානුරූපීව මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ එක් එක් ප්‍රදේශය එම වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2013 මාර්තු මස 11 වැනි දින,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

I වැනි උපලේඛනය

**එරාවූර් නාගරික සංවර්ධන බල ප්‍රදේශය**

*I වැනි තීරුව*

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වන්නාවූ මෙහි II වැනි තීරුවෙන් විස්තර වන ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක (190) එරාවූර් - 1, (190ඒ) එරාවූර් - 1ඒ (191) එරාවූර් - 2, (191ඒ), එරාවූර් - 2 ඒ, (191බී) එරාවූර් - 2 බී, (192) එරාවූර් - 3, (192ඒ) එරාවූර් - 6, (192බී) එරාවූර් - 3ඒ, (192සී) එරාවූර් - 6ඒ, (194) එරාවූර් - 4, (194ඒ) එරාවූර් - 5, (194බී) එල්ලෙයිනගර්, (190බී) එරාවූර් - 1බී, (191සී) එරාවූර් - 2 සී, (192ඩී) එරාවූර් - 6 ඩී, යන ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත මුළු ප්‍රදේශය.

*II වැනි තීරුව*

උතුරට :

උතුරු මායිම් පාර ත්‍රිකුණාමලය - මඩකලපුව පාර හමුවන ආරම්භක ලක්ෂ්‍යයේ සිට උතුරු මායිම් පාර ඔස්සේ ඊසාන දෙසට නැගෙනහිර මායිම පාර හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට එකී පාර ඔස්සේ ගිණිකොණ දිසාවට කුඩියිරුප්පු පටුමගෙහි උතුරු අන්තය හමුවන ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින් ද ;

*I වැනි උපලේඛනය* (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
| --- | --- |
| 04 - 308 | නැගෙනහිරට :<br>අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට දකුණු දෙසට කුඩියිරුප්පු පටුමග ඔස්සේ ත්‍රිකුණාමලය - මඩකලපුව මාර්ගය හරහා කුඩියිරුප්පු පටුමගෙහි ප්‍රතිවිරුද්ධ පටුමග හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට එම පටුමග හා කුඹුරු ඉඩම ඔස්සේ කලපුව දක්වා අඳින ලද රේඛාවකින් ද ;<br><br>දකුණට :<br>අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට කලපුවේ පහළ ජල මට්ටම ඔස්සේ බටහිර දිසාවට නියනවේලී කුඹුරු පටුමග හමුවන ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින් ද ;<br><br>බස්නාහිරට : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කුඹුරු පටුමග සහ වඩ්ඩවිඩානේ පටුමග ඔස්සේ උතුරු දෙසට තමරවික්කුලම් දක්වා ද, එතැන් සිට තමරවික්කුලම් නැගෙනහිර හා උතුරු මායිම් ඔස්සේ කරත්ත පාර හමුවන තෙක් ද, එතැන් සිට කරත්ත පාර ඔස්සේ ආරම්භක ලක්ෂ්‍යය හමුවන තෙක් අඳින ලද රේඛාව. |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.